**ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2012**

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>තත්ත්වාගණනය කළමතය</u>

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්</u>

1.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

2011 හා 2012 වර්ෂ වෙනුවෙන් ගෙවා නොතිබුණු විගණන ගාස්තු රු.269,883 ක් වී තිබුණත්, මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි විගණන ගාස්තු ලෙස රු.140,857 ක් දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වූ හිඟහිටි විගණන ගාස්තුවරු.129,026 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.2.2 <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ගෙනවිත් තිබුණු ශේෂයන් අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය/ වැඩසටහන | ඉකුත් වර්ෂය අවසානයට වූ ශේෂය | සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ගෙන තිබුණු අගය | ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| (අ) සාමාන්‍ය අරමුදල | 110,895,505 | 111,971,955 | 1,076,450 |
| (ආ) පිලික්ස් ඩයස් බණ්ඩාරනායක අරමුදල | 1,161,576 | 1,471,037 | 309,461 |
| (ඇ) වෛද්‍ය පර්යේෂණ ආයතනය | 12,306,702 | 11,679,783 | (626,919) |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ජාතික සෞඛ්‍ය විද්‍යායතනය - කළුතර | 815,537 | 544,979 | (270,558) |
| (ඉ) | අරමුදල් වෙබ් අඩවිය | - | 18,028 | 18,028 |
| (ඊ) | රාගම රෝහලේ ටයිල් ඇතිරීමේ ව්‍යාපෘතිය | 155,378 | - | (155,378) |
| (උ) | ළදරු හා ළමාපෝෂණය පිළිබඳ සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන | 2,400,912 | 1,716,570 | (684,342) |
| (ඌ) | අක්ෂි රෝහලට අක්ෂිකාච පරිත්‍යාග කිරීම | - | 22,500 | 22,500 |

1.2.3 <u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

රාජ්‍ය ආයතනයක් විසින් මෙහෙයවනු ලබන ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාතික අක්ෂි බැංකුවේ කළමනාකරු වෙනුවෙන් රු.92,000 ක මුදලක් ජාතික අක්ෂි බැංකුවෙන් ගෙවා තිබුණි. මේ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේමෙහෙයුම් වලින් වූ අතිරික්තය රු.101,376,270 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.73,205,838ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.28,170,432 ක වර්ධනයක් ඇතිවීම සඳහා සියළුම ආදායම් මූලාශ්‍ර රු.62,685,496 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විවිධ කාර්යයන් 6 ක් සඳහා වර්ෂ 4 සිට වර්ෂ 25 දක්වා කාල පරාසයකදී ලැබී තිබුණු එකතුව රු.7,659,081 ක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 1990 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා විවිධ ආයතනවලින් විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා ලබාදුන් එකතුව රු.32,389,566 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම කාර්යයන් ඉටු නොකර,පොදු අරමුදලට බැරකර තිබුණි.

(ඇ) ඩෙංගු ආවේක්ෂණ ව්‍යාපෘතිය යටතේ රෝගීන්ගේ රුධිර සාම්පල් ලබා ගැනීමේදී අනාවරනය වූ අඩුපාඩු පහත දැක්වේ.

(i). සමාලෝචිත වර්ෂයේ පලමු මාස 9 තුළදී ඩෙංගු ආවේක්ෂණ ව්‍යාපෘතිය යටතේ රෝගීන්ගේ රුධිර සාම්පල් 2250 ක් පරීක්ෂා කිරීම ඉලක්කය වී තිබුණත් පරීක්ෂා කර තිබුණේ රුධිර සාම්පල් 1442 ක් හෙවත් සියයට 64ක් ප්‍රතිශතයක් විය.

(ii). රුධිර සාම්පල් එකතු කිරීම සඳහා තෝරාගෙන තිබු පෞද්ගලික ඩිස්පෙන්සරි අතරින් 3 කින් 2012 දෙසැම්බර් මාසය තුළදී එක් රුධිර සාම්පලයක්වත් ලබාගෙන නොතිබුණි. තවද පෞද්ගලික ඩිප්පෙන්සරියකින් සමාලෝචිත වර්ෂයේ පළමු මාස 09 ක කාලය තුළදීරුධිර සාම්පල් 16 ක් පමණක් ලබාගෙන තිබුණි. කොළඹ දිස්ත්‍රික්කය තුළ ඩෙංගු රෝගී ව්‍යාප්තිය වැඩි කාල පරිච්ඡේදයක රෝගීන්ගේ රුධිර පරීක්ෂාවන් ඉටු කිරීමේ ප්‍රමාණාත්මකභාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඩෙංගු ආවේක්ෂණ ව්‍යාපෘතියට මාස 3 ක කාලයක් සඳහා රසායනාගාර කටයුතු සැපයීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස රු.4,510,000 ක්පෞද්ගලික ආයතනයකට ලබාදී තිබුණද,ඒ සඳහා අත්තිකාරම් බැඳුම්කරයක් ලබාගෙන නොතිබුණි.

(ආ) නිවැරදිව වියදම් ඇස්තමේන්තු කිරීමකින් තොරව අත්තිකාරම් ලබාදීම නිසා මාස 3 ක රසායනාගාර ගාස්තු වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ලබාදී තිබුණු අත්තිකාරම් එම ආයතනයේ මාස 6 ක වියදම් පියවා ගැනීමට උපයෝගී කරගෙන තිබුණි.

(ඇ) අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්කවල සෞඛ්‍ය මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීම සඳහා වු රු.79,569,908 ක් වු කොන්ත්‍රාත්තුව කාර්යාංශයක් වෙත පිරිනමා තිබුණි. 2012 අගෝස්තු 20 දිනැති සෞඛ්‍ය සංවර්ධන අරමුදල් රැස්වීම් තීරණය පරිදි ඊට අදාළව ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර, ඒ සම්බන්ධ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණත්,එවැනි වාර්තාවක් ඉදිරිපත් නොකර අවසන් ගෙවීම කර තිබුණි.

(ඇ) ජාතික අක්ෂි රෝහලෙන් ජාතික අක්ෂි බැංකුව වෙත වසර දෙකක කාලයක් සඳහා ද්වීතියන පදනම මත අනුයුක්ත කරන ලද නිලධාරීන් දෙදෙනෙකුගේ පත්වීම් කාලය අවසන්ව තිබුණද,තවදුරටත් විධිමත් අනුමැතියකින් කාලය දීර්ඝ නොකර ජාතික අක්ෂි බැංකුවෙන් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

ඩෙංගු ව්‍යාපෘතියේ රසායනාගාර කටයුතු කරනපෞද්ගලික ආයතනයක රසායනාගාර උපදේශකවරයෙක් වෙත 2012 අප්‍රේල් මාසයේදී විදේශ සංචාරයක ගුවන් ටිකට්පත් ගාස්තු වශයෙන් රු.257,437 ක් ගෙවා තිබුණි.

ඩෙංගු ව්‍යාපෘතිය ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රමිතියට අනුව සිදුකළ යුතු අතර, මෙවැනි සුවිශේෂී පර්යේෂණ සඳහා බාහිර විශේෂඥයින්ගේ නිරීක්ෂණ හා උපදෙස් ලබාගැනීම අන්තර්ජාතික පර්යේෂණවලදී සිදුවන්නක් බව සෞඛ්‍ය ලේකම්වරයා පිළිතුරු දී තිබුණි.

3.4 **අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන්නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවක් විසින් රු.10,000,000 ක් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ ප්‍රතිකාර ගන්නා සෙබළුන්ට අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබාගැනීම සඳහා අරමුදල වෙත පරිත්‍යාග කර තිබුණි. එම පරිත්‍යාග මුදලින් සියයට 58.51ක් හෙවත් රු.5,850,888 ක ශේෂයක් එම කාර්යයට යෙදවීමකින් තොරව 2012 දෙසැම්බර් 31 දින වනවිටත් සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ රඳවාගෙන තිබුණි.

(ආ) රාජ්‍ය සංස්ථාවක් විසින් වෛද්‍යවරුන්ගේ නිල නිවාස වැඩිදියුණු කිරීම, ජනතාවගේ සනීපාරක්ෂක කටයුතු හා ජල ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම යන කාර්යයන් සඳහා 2009 වර්ෂයේදී රු.20,000,000 ක් අරමුදල වෙත පරිත්‍යාග කර තිබුණි. එහෙත් ඉහත මුදලින් මහරගම දන්ත චිකිත්සක විද්‍යාලයේ සිසුවියන්ගේ ප්‍රායෝගික පුහුණුව සඳහා රු.1,343,776 ක වටිනාලිබඩු උපකරණ පමණක් ලබාදී තිබුණි. එම පරිත්‍යාග මුදලින් රු.18,656,224 ක් එනම් සියයට 93.28 ක්2012 දෙසැම්බර් 31 දින දක්වාම (වර්ෂ 3 ක්) සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ රඳවාගෙන තිබුණි.

3.5 **ආර්ථික නොවූ ගනුදෙනු**

ඉංගිරිය දිසා රෝහලේ වාට්ටු අංක 3 හා 4 සහිත ගොඩනැගිල්ලේ රු.79,800 ක් වැයකර විදුලි සැපයුම අළුත්වැඩියා කර තිබුණද, විදුලි පද්ධතියේ පවත්නා දෝෂ හේතුවෙන් නිතර නිතර විදුලි බුබුළු පිලිස්සීම සිදු වී තිබුණි.

විදුලි පද්ධතිය වසර 150 කට වඩා පැරණි බැවින් එහි ඇති යම් යම් දෝෂ නිසා විදුලි බුබුළු පිලිස්සීම සිදු වන බව ලේකම්වරයා විසින් මා වෙත වාර්තා කර තිබුණි.

3.6 **කොන්ත්‍රාත්පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන්නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉංගිරිය දිසා රෝහලේ බාහිර රෝගී අංශයේ ගොඩනැගිල්ල අළුත්වැඩියාවේ රඳවාගෙන තිබුණු රු.30,042 ක මුදල 2012 මැයි 21 දින නිදහස් කර තිබුණත්, **කොන්ත්‍රාත්තුවේ වූ පහත** සඳහන් අඩුපාඩු වෙනුවෙන් එම රඳවාගත් මුදල් අඩුකර ගෙන නොතිබුණි.

(i) ඇස්තමේන්තුවේ සඳහන් වර්ගයට පරිබාහිර වූ වර්ගයකින් ඩෝ ක්ලෝසර් තුනක් සවිකර තිබීම සහ 2013 පෙබරවාරි 28 දින වන විට එම තුනම අක්‍රියව පැවතීම.

(ii) නියමිත ප්‍රමිතියට අඩු ප්ලාස්ටික් වර්ගයේ ජල කරාමයක් රු.20,000 ක් වැයකර සවිකර තිබීම.

(iii) කැනපි රූෆ් දෙකක් සවිකිරීම වෙනුවෙන් රු.56,000 ක මුදලක් ගෙවා තිබුණද, එකක් පමණක් සවිකර තිබීම.

(ආ) දකුණු කොළඹ ශික්ෂණ රෝහලෙහි විශේෂ ළදරු ඒකකය සංවර්ධනය කිරීම සඳහා රු.2,652,860 ක කොන්ත්‍රාත්තුවක් 2012 පෙබරවාරි 15 දින පිරිනමා තිබුණි.මෙකී කාර්යය නිමකර මාස 7 ක්ද ගතවීමෙන්ද අනතුරුව රු.636,100 ක් වූ අමතර වැඩ ඇස්තමේන්තුව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කර රු.634,902 ක් වැයකර තිබුණි.

(ඇ) වාරියපොල ගිලන්රථ ගරාජය සහ රියදුරු නිල නිවස ඉදිකිරීම සඳහාවූ කොන්ත්‍රාත් මුදල (බදු රහිත) රු.1,716,660 ක් වී තිබුණි. මුල්වරට සකසන ලද ඇස්තමේන්තුව පදිංචියට අවශ්‍ය අවම මූලික සුදුසුකම් රහිතව සකසා තිබීම හේතුවෙන් නැවතත් එය රු.340,000 ක් වන පරිදි සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. එම කාර්යය නිම කිරීම සඳහා වෙනත් ග්‍රාම සංවර්ධන සමිතියකට පවරා තිබුණි.සැලසුම් සහගතව ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් කාර්යය නිම කිරීමට මාස 9 ක් ප්‍රමාද වී තිබුණි.

(ඈ) යාපනය තෙලිප්පලෙහි පිළිකා රෝගීන් සඳහා රෝහලක් ඉදිකිරීම අරමුණු කරගෙන පෞද්ගලික ආයතනනක් විසින් මහජනතාවගෙන් අරමුදල් රැස්කර තිබුණි. මෙම ව්‍යාපෘතියෙහි පිරිවැය රු.200,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.මෙකී මුදල සෞඛ්‍ය සංවර්ධන අරමුදල වෙත තැන්පත් කර ව්‍යාපෘතියෙහි කටයුතු නිම කිරීමට ඉහත ආයතනය එකඟ වී තිබුණු අතර 2012 සැප්තැම්බර් 12 දිනදී කොන්ත්‍රාත්තුව එම ආයතනයට පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත අඩුපාඩු අනාවරනය විය.

(i) 2012 මාර්තු 16 දිනැති අවබෝධතා ගිවිසුමේ 4(a) සහ 4(l) වගන්තිඅනුව පහත සඳහන් අවශ්‍යතා සපුරා නොතිබුණි.

- ගිවිසුම අත්සන් කිරිමෙන් සතියක් ඇතුළත රු.100,000,000 ක මුදලක් අරමුදලෙහි තැන්පත් කළ යුතු වුවද,2012 සැප්තැම්බර් 14 දිනදීඑම මුදල් තැන්පත් කර තිබීම
- ගිවිසුම අත්සන් කිරීමෙන් පසු මාසයක් ඇතුළත දී කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කළ යුතු වුවද, ඉන් මාස 5 ක් ගතවීමෙන්දඅනතුරුව කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කර තිබීම

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.4.4(i) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයක් අත්තිකාරම් ලෙස ගෙවිය හැකි වුවද, ඉන් සියයට 35 ක මුදලක් වූ රු.68,679,412 ක මුදලක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි.

(iii) කොන්ත්‍රාත්තුව අවසන් කළ යුතු දිනය 2013 ඔක්තෝබර් 03 දින වුවද, 2013 සැප්තැම්බර් 05 දිනවන විටත් ඉදිකිරීම් ප්‍රගතිය සියයට 50 කට හෝ ළගාවී නොතිබුණි.

4. <u>අයවැය පාලනය</u>

අයවැය ලේඛනය හා තථ්‍ය වියදම් විෂයයන් හතක සියයට 33.8 සිට සියයට 228.4 දක්වා පරාසයක විචලනයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

5. <u>පද්ධති සහ පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ ලේකම්වරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂෙත්‍රයන් කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) අත්තිකාරම් ලබාදීම

ඇමුණුම 1

**<u>ආදායම් හා වියදම් ප්‍රකාශය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමග සසදා පහත දක්වා ඇත.

| **<u>ආදායම</u>** | **<u>දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය</u>** | | | |
|---|---|---|---|---|
| | **<u>2012</u>** | | **<u>2011</u>** | |
| | රු. | රු. | රු. | රු. |
| ජාතික සම්පත ලොතරැයි ආදායම | 52,560,260 | | 39,228,040 | |
| පරිත්‍යාග | 155,139,494 | | 130,926,696 | |
| ආයෝජන පොලී | 30,538,493 | | 14,192,687 | |
| අනෙකුත් ආදායම් | 9,878,521 | 248,116,768 | 1,083,848 | 185,431,271 |
| **<u>වියදම</u>** | | | | |
| පරිපාලන වියදම් | 1,597,636 | | 1,190,256 | |
| මූල්‍ය හා අනෙකුත් වියදම් | 16,420 | | 39,014 | |
| සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති වියදම් | 145,126,441 | 146,740,497 | 110,996,163 | 112,225,433 |
| අතිරික්තය | | 101,376,271 | | 73,205,838 |
| පෙර වර්ෂ ගැලපුම් | | 1,126,723 | | 6,157,268 |
| | | <u>102,502,994</u> | | <u>79,363,106</u> |

ඇමුණුම 2

<u>ආයෝජන ප්‍රකාශය</u>

<u>ස්ථාවර තැන්පත්</u>

| සහතිකයේ අංකය | ආයෝජනය කළ දිනය | ආයෝජන කාලය | 2012 ජනවාරි 1 දිනට ශේෂය | 2012 වර්ෂය තුළ ආයෝජනය කිරීම් | 2012 වර්ෂය තුළ ආපසු ගැනීම් | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. |
| 329646 | 2011.12.21 | මාස 3 | 63,000,000 | - | - | 63,000,000 |
| 331074 | 2011.12.21 | වර්ෂ 1 | 23,000,000 | - | - | 23,000,000 |
| 329711 | 2012.03.14 | වර්ෂ 1 | - | 10,000,000 | - | 10,000,000 |
| 329770 | 2012.05.30 | මාස 3 | - | 15,000,000 | - | 15,000,000 |
| 331081 | 2012.12.28 | මාස 3 | - | 1,500,000 | - | 1,500,000 |
| 331050 | 2012.12.12 | මාස 3 | - | 20,000,000 | - | 20,000,000 |
| 331049 | 2012.12.12 | මාස 3 | - | 20,000,000 | - | 20,000,000 |
| | | | 86,000,000 | 66,500,000 | - | 152,500,000 |

<u>භාණ්ඩාගාර බිල්පත්</u>

| සහතිකයේ අංකය | ආයෝජනය කළ දිනය | ආයෝජන කාලය | 2012 ජනවාරි 1 දිනට ශේෂය | 2012 වර්ෂය තුළ ආයෝජනය කිරීම් | 2012 වර්ෂය තුළ ආපසු ගැනීම් | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | දින | රු. | රු. | රු. | රු. |
| 20101000226 | 2012.10.11 | 84 | 5,679,909 | - | | 6,244,852 |
| 201006221 | 2012.06.08 | 357 | 18,276,260 | - | | 19,592,146 |
| 2010060157 | 2012.06.08 | 357 | 3,729,604 | - | | 3,569,408 |
| 201010021 | 2011.10.07 | 91 | 1,965,360 | - | 1,965,360 | - |
| 2010100064 | 2011.10.07 | 91 | 16,184 ,124 | - | 16,184,124 | - |
| 314 | 2012/03/09 | 364 | 13,434,486 | - | - | 14,388,332 |
| 314 | 2012/11/16 | 91 | 23,673,177 | - | - | 23,505,905 |
| 314 | 2012/12/07 | 182 | 4,800,770 | - | - | 4,721,435 |
| 314 | 2012/11/23 | 182 | 7,703,416 | - | - | 7,556,080 |
| 314 | 2012/08/31 | 182 | 6,048,312 | - | - | 5,883,461 |
| 314 | 2012/08/31 | 364 | 12,129,573 | - | - | 11,475,942 |
| 314 | 2012/10/19 | 182 | 40,291,356 | - | - | 39,425,005 |
| M12B 024498 | 2012/12/31 | 7 | - | 20,000,000 | - | 20,000,000 |
| M11B 024103 | 2011/12/28 | 6 | 14,500,000 | - | 14,500,000 | - |
| M11B 024104 | 2011/12/28 | 6 | 10,000,000 | - | 10,000,000 | - |
| | | | 178,416,347 | 20,000,000 | 42,649,484 | 156,362,566 |